ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2116/44 - 2019 මාර්තු මස 27 වැනි බදාදා - 2019.03.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78(xv)

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත

27(1) වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම්, ජලසම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍ය අ. ඉබතුල් රවුෆ් හකීම් වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, මෙම නියමය මගින් 2005 ජුනි මස 01 වන දින අංක 1395/15 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලදුව, 2018 ජූලි මස 09 වන දින අංක 2079/12 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමය මගින් අවසන් වරට සංශෝධිත පරිදි වූ, ඉහත කී පනතේ 21 වන වගන්තිය යටතේ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය පිහිටුවමින් සාදන ලද නියමයේ උපලේඛනය, පහත පරිදි සංශෝධනය කරනු ලැබේ :-

(1) 1 වන තීරයේ දැක්වෙන ''1. විද්‍යා හා තාක්ෂණ පීඨය'' යන අයිතමය සහ ඊට අනුරූප වන්නා වූ එහි II වන තීරයේ දැක්වෙන ''1'' සහ ''2'' සටහන් ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අයිතමය සහ සටහන් ආදේශ කිරීමෙන් :-

''1. ව්‍යවහාරික විද්‍යා පීඨය	1. විද්‍යා හා තාක්ෂණ අධ්‍යයන අංශය
	2. පරිසනක විද්‍යා හා තොරතුරුවේද අධ්‍යයනාංශය ; '' ; සහ

(2) 1 වන තීරයේ දැක්වෙන ''2. කළමනාකරණ පීඨය'' යන අයිතමයට අනුරූප වන්නා වූ එහි II වන තීරයේ දැක්වෙන ''3'' සටහනට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් සටහන එකතු කිරීමෙන් :-

''4. සංචාරක අධ්‍යයන අධ්‍යයනාංශය.''.

අ. ඉබතුල් රවුෆ් හකීම්,
නගර සැලසුම්, ජලසම්පාදන හා
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2019 මාර්තු මස 25 වැනි දින,
කොළඹ දී ය.

04 - 345

1A - PG 4450 — 518 (2019/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
මෙම *අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.